Uva Wellassa University

## ජාතික සංවර්ධනයට දායකවීමේ අභිමානය අත්කර ගන්න අධ්‍යයන කාර්යය මණ්ඩල ඇබෑර්තු

# ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

## කළමනාකරණ පීඨය

## ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ දෙපාර්තමේන්තුව

**තනතුර** : **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය. ශ්‍රේණිය I/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශ්‍රේණිය II / කථිකාචාර්ය (ස්ථිර නොකළ) / කථිකාචාර්ය (පරිවාස)**

**විෂය ක්ෂේත්‍රය** : 01. ඉංග්‍රීසි භාෂාව සහ වාග්විද්‍යාව

**අවශ්‍ය සුදුසුකම්** : අයදුම්කරුට අදාල සුදුසුකම් සමග ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂිත ශාස්ත්‍රවේදී උපාධියක් තිබිය යුතුය.

**විෂය ක්ෂේත්‍රය** : 02 ඉංග්‍රීසි භාෂාව සහ අධ්‍යාපනය

**අවශ්‍ය සුදුසුකම්** : අයදුම්කරුට අදාල සුදුසුකම් සමග ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂිත ශාස්ත්‍රවේදී උපාධියක් තිබිය යුතුය.

**සුදුසුකම්**

**සටහන :** සුදුසුකම් අවශ්‍යතා සපුරාලන විශේෂඥතාවයක් සහිත අපේක්ෂකයින්, අදාළ UGC චක්‍රලේඛ අංක 721,996, 08/2016, සහ 07/2018 පරිශීලනය කරන මෙන් හෝ **www.ugc.ac.lk** වෙබ් අඩවිය වෙත පිවිසෙන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

අදාල චක්‍රලේඛවල දක්වා ඇති පරිදි කථිකාචාර්ය (පරිවාස) සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (ශ්‍රේණිය I/II) තනතුරු සඳහා පශ්චාත් උපාධි සුදුසුකමක් තිබීම අනිවාර්යය වේ.

**වේතන සහ ප්‍රතිලාභ**

**වැටුප් පරිමාණය**

- **කථිකාචාර්ය (පරිවාස) - [U-AC3(IV)]**
  රු. 94,400 – 10X2,400 – 118,400 (මාසිකව)
- **කථිකාචාර්ය (ස්ථිර නොකළ) [U-AC3(III)]**
  රු. 121,340 – 5X2,940– 136,040 (මාසිකව)
- **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (ශ්‍රේණිය II) [U+AC3(II)]**
  රු. 138,980–11X2,940–171,320 (මාසිකව)
- **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (ශ්‍රේණිය I) [U-AC3(I)]**
  රු. 160,520–7X3,900–187,820 (මාසිකව)

**අතිරේකව, විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා අදාළ රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.**

යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාල සහතිකවල සහතික කරන ලද සත්‍ය පිටපත් (අනු පිටපත්) සමග 2025.09.05 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී මානව සම්පත් අංශය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පස්සර පාර, බදුල්ල ලිපිනය වෙත එවිය යුතුය.

**වැදගත් :** ඊට අමතරව ඔබගේ අයදුම්පත ගූගල් පෝරමය හරහා ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර, ඔබගේ අයදුම්පතෙහි ස්කෑන් පිටපතක්, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර ගූගල් පෝරමය වෙත උඩුගත කළ යුතුය.

විශ්වවිද්‍යාල වෙබ් අඩවිය වන www.uwu.ac.lk වෙත පිවිසීමෙන් අයදුම්පත් ආකෘති සහ ගූගල් පෝරම, අවශ්‍ය සුදුසුකම් සහ වෙනත් අදාල තොරතුරු ලබාගත හැක.

ගූගල් පෝරමය හරහා ඔබගේ අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. කරුණාකර පෝරමය නිවැරදිව සහ නිශ්චිත කාලසීමාව තුළ සම්පූර්ණ කිරීමට වගබලාගන්න.

එක් තනතුරකට වඩා වැඩි ගණනක් සඳහා අයදුම්කරනු ලබන අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා වෙන් වෙන් කවර තුළ වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. වඩා කැමති විෂය ක්ෂේත්‍රය අයදුම්පතෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

විශ්වවිද්‍යාල පද්ධතිය / රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලහි සේවයේ නියුතු අයදුම්කරුවන් අදාල ආයතන ප්‍රධානියා හරහා අයදුම්කළ යුතුය. නිසි මාර්ගයෙන් නොලැබෙන සහ නිර්දේශිත ආකෘතියෙන් තොරව ඉදිරිපත් කරන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අසම්පූර්ණ අයදුම්පත්, සහයක ලිපිලේඛන රහිත අයදුම්පත් සහ භාර ගන්නා අවසන් දිනය පසුව ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයින් කෙටි ලැයිස්තුගත කිරීමේ සහ එම අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ.

**වැඩබලන ලේඛකාධිකාරී,**
**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය,**
**පස්සර පාර, බදුල්ල.**
**2025.08.06**